*සැ. යු.*- 2021.01.01 දින පළ වූ අංක 2,209 දරන *ගැසට් පත්‍රයේ* I : III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,210 - 2021 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2021.01.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 02 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | -- |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | -- |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | -- |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |


*සැ. යු.* - ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජනවාරි මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජනවාරි මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජනවාරි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 - B 82094— 5,403 (2021/01)
F 1 -

# පළාත් සභා නිවේදන

## පළාත් සභා නිවේදන

### වයඹ පළාත් සභාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2019.05.16 දින මහ සභා තීරණ අංක xi යටතේ සම්මත කර ඇති යෝජනාව, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර අහමඩ් ජමල්ඩීන් මොහොමඩ් මුසම්මිල් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2 (2) වගන්තියේ විධි විධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අහමඩ් ජමල්ඩීන් මොහොමඩ් මුසම්මිල්,
වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර.

2020 ජූලි මස 01 වැනි දින.

01-406

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.